# හින්දූන්ගේ විවාහ විධි පිළිබඳව අධ්‍යයනයක්

***විජේතිලක, එම්. ඒ. අයි. යූ.*** [1]

මිනිසාගේ උපතේ සිට මරණය දක්වා ජීවිතයේ වැදගත් අවස්ථාවන්හි සිදු කළ යුතු ආගමික උත්සව නැතහොත් ආගමික සංස්කාර පහළොවක් හින්දූ ආගමික චින්තාව තුළ දක්වා ඇත. එයින් ඉතාම වැදගත් අවස්ථාවක් වන්නේ විවාහයයි. හින්දූහු විවාහය තම සමාජයේ පදනම ලෙසත් වැදගත් ආගමික උත්සවයක් ලෙසත් එදත්-අදත් සලකති. මෙනිසා විවාහය සෑම පුද්ගලයෙකුටම අනිවාර්ය වූවක් වූ අතර, විවාහ නොවූ පුද්ගලයන් සමාජයෙන් කොන් කරනු ලැබිණ. ස්ත්‍රියට කිසි විටකත් අවිවාහකව සිටීමේ හැකියාවක් නොවූ අතර, පිතෘ දානය දීමට නම් විවාහ වී පුතෙකු ලැබීම අනිවාර්ය විය. හින්දූන්ගේ ආගමික ග්‍රන්ථ අතර ප්‍රමුඛත්වයෙහිලා ගැනෙන ඍග් වේදයේ විවාහය පිළිබඳව කරුණු දක්වනු ලබන විවාහ සූක්තයට අනුව මනමාලයා තම නෑදෑයන් සමග මනමාලියගේ ගෘහයට යයි. ඇය විවාහයට සැරසී සිටියි. මංගල අවස්ථාවේදී මේ දෙපළ අග්නි ප්‍රදක්ෂිණා කොට පෙරහැරින් මනාලිය මනාලයාගේ නිවස කරා රැගෙන යනු ලැබෙන බව දැක්වෙයි. එකල සමාජයේ සම්මත සිරිත වූයේ එක් ස්ත්‍රියක හෝ එක් පුරුෂයෙකු විවාහ කර ගැනීම වුවද, බහුභාර්යා සේවනයද පැවති බව ඍග් වේදයේ සඳහන් වේ. හින්දූහු තමන්ගේ වර්ණයේ නිර්මලත්වය රැක ගැනීම සඳහා අඩු වයසින් දරුවන් විවාහ කර දෙන්නට වූහ. එකී තත්ත්වය අතීතයේ පමණක් නොව අදටත් දක්නට ලැබෙයි. හින්දූන් කිසිවිටකත් එකම ලේ නෑයන් සමග විවාහ නොවූ අතර, එය ආගමෙන් පවා තහනම් විය. නමුත් අසමාන වර්ණ අතරද, එකම ගෝත්‍රයේ ලේ නෑයන් නොවන අය අතරද විවාහයන් සම්මත කරන ලදි. මේ අනුව බ්‍රාහ්මණයෙකුට බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය හෝ වෛශ්‍යය ස්ත්‍රියක සරණ පාවා ගත හැකි විය. එහෙත්, කිසිම හේතුවක් නිසා ශුද්‍රයන්ට තමාට වඩා උසස් කුලයකින් හෝ වර්ණයකින් කාන්තාවක් විවාහ කර ගැනීමේ වරප්‍රසාදයක් නොලැබිණ. මෙම පර්යේෂණයේ අරමුණ හින්දූන්ගේ විවාහ විධි පිළිබඳව සහ ඔවුන් තම වර්ණ සංරක්ෂණය උදෙසා මෙම ආගමික සංස්කාරයන් යොදා ගන්නා ආකාරය විමසා බැලීමය.

ප්‍රමුඛ පද : විවාහය, ආගමික සංස්කාර, වර්ණ සංරක්ෂණය, ස්වාමිපුරුෂයා, ඍග් වේදය

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රථම වසර, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*inderjith1995@gmail.com*